කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය

# ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය 2021/2022
# SOC 4187 – ප්‍රජා සමාජ කාර්යවේදය

කාලය : පැ දෙකයි (02)

ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

1. 'සමාජයක පවතින සමාජ අසමානතාවන් සහ පීඩාකාරී තත්ත්වයන් අවබෝධ කරගැනීමේදී සමාජ කාර්යවේදියාට ස්වයං අන්තරාවලෝකනය (self-reflection) වැදගත් වේ'. මයිකල් ස්පෙන්සර්ගේ (Michael Spencer) (2008) 'A Social Worker's Reflections on Power, Privilege and Oppression' යන ලිපිය ඇසුරෙන් මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

2. 'සමාජ කාර්යවේදීන් විසින් ප්‍රජාවන් බලගැන්වීම සඳහා මැදිහත්වීමේදී බලය සහ අවාසිදායක තත්ත්වයන්ගේ බහුවිධ ස්වභාවයන් පිළිබඳව අවධානය යොමු කළ යුතුය'. ජිම් ලයිෆ්ගේ (Jim Life) (1995) න්‍යායාත්මක අදහස් ඇසුරෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

3. ප්‍රජාව බලගැන්වීමේ ක්‍රියාවලියේදී විවිධ ප්‍රජාවන් අතර අධිවාචක සන්ධානයන් ගොඩනැගීම අභියෝගාත්මක ක්‍රියාවලියකි. මරියා රොබට්ස්-ඩිජෙනරෝගේ (Maria Roberts-DeGennaro) (1986) 'Building Coalitions for Political Advocacy' යන ලිපිය සහ ශ්‍රී ලාංකේය සමාජය ඇසුරෙන් මෙම ප්‍රකාශය විවේචනාත්මක සාකච්ඡා කරන්න.

4. පවුලෝ ෆ්රෙයරේ (Paulo Freire) විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්නාභියෝගී අධ්‍යාපනය (Problem-posing Education) යන ක්‍රමවේදය යොදාගනිමින් අඩු ආදායම්ලාභී ප්‍රජාවන් තුළ ඔවුන්ගේ ජීවන තත්ත්වය පිළිබඳව සවිඥානිකත්වයක් ඇති කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

5. සමාජ පීඩනයට එරෙහිව සාමූහිකව කටයුතු කිරීමේදී තනි පුද්ගලයන්ගේ අවශ්‍යතා ද නියෝජනය වීම වැදගත් වේ. මෙම ප්‍රකාශය ලීනා ඩොමිනෙලි (Lena Dominelli) සහ ජෝ කැම්ප්ලින්ගේ (Jo Campling) (2002) න්‍යායාත්මක අදහස් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

6. සිල්වියා මාර්ටි-කොස්ටා (Sylvia Marti-Costa) සහ ඉර්මා සෙරානෝ-ගාර්ෂියා (Irma Serrano-Garcia) (1983) විසින් ඉදිරිපත් කර ඇති අවශ්‍යතා තක්සේරුවක් සිදු කිරීමේදී සලකා බැලිය යුතු සාධක අඩු ආදායම්ලාභී ප්‍රජාවක් සඳහා යොදාගත හැකි ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

**************